# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,350 - 2023 සැප්තැම්බර් මස 15 වැනි සිකුරාදා - 2023.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 342 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 344 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ඔක්තෝබර් මස 06 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.01.29 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/කොත්/1361 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන මරක්කයාතුඹුර හි පදිංචි ආනා මජීදු ලෙබ්බේ වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කොත් 51/1322/97 යටතේ 1997.07.25 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.10.27** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපනේ කෝරළේ රොජසන්ගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මරක්කයාතුඹුර නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර දෙකයි (02) රූඩ් තුනයි (03) පර්චස් තිස්දෙක (32) ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - මරක්කයාතුඹුර

| | |
|---|---|
| *උතුරට* | : එම්. බදුර්දීන්ගේ රජයේ ඉඩමේ මායිම, |
| *නැගෙනහිරට* | : ඊබ්‍රාහිම් ලෙබ්බේ අමීර්ගේ ඉඩමේ මායිම, |
| *දකුණට* | : එම්. ජේ. ජී. ලෙබ්බේගේ ඉඩමේ මායිම, |
| *බස්නාහිරට* | : ගම් සභා පාර රක්ෂිතය. |

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
තිස්පනේ උප කාර්යාලය.

2023 ජුනි මස 24 වැනි දින.

09-205/1

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.11.10 දින ප්‍රදානය කර ඇති අංක නු/කොත්/රොත්/ප්‍ර/ගො/139 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන පුස්සැල්ලාව, රොත්ස්චයිල්ඩ් පදිංචි අධිකාරි ගෙදර රන්හාමි වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කො 19/619/89 යටතේ 1989.12.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.10.27** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේපනේ පත්තුවේ/ කෝරළේ 456 ඒ නවකඩදොර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නවකඩදොර නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක මු.පි.නු. 736 දරන කට්ටි කැඩීමේ පිඹුරේ 106 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.070 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - රොක්ස්චයිල්ඩ්

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 80 (මාර්ගය) සහ කැබලි අංක 107, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 107 සහ හි. පි. 49192, |
| *දකුණට* | : හි. පි. 49192 සහ කැබලි අංක 106, |
| *බස්නාහිරට* | : කැබලි අංක 106 සහ කැබලි අංක 80 (මාර්ගය). |

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කොත්මලේ.

2023 මැයි මස 15 වැනි දින.

09-205/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් 08 වන දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/632 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන බිලැක්පූල්, නවජනපදයෙහි පදිංචි එළිසබෙත් කෙයිසර් මහත්මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/11/1137/95 අංකය යටතේ 1995.12.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.10.27** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ වින්ඩ්කෝනර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බිලැක්පූල් නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත අංක නුවි/86/83 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 149 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් 20 පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : මාර්ගය,
*නැගෙනහිරට* : මාර්ගය සහ ලොට් අංක 148,
*දකුණට* : ලොට් අංක 158,
*බස්නාහිරට* : ලොට් අංක 150.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2023 මාර්තු මස 18 වැනි දින.

09-205/3

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් 08 වන දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/579 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන නව ජනපදය බිලැක්පූල් හි පදිංචි සිග්ගප්පුල්ගේ ස්වර්ණලතා මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/11/1084/95 අංකය යටතේ 1995.12.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.10.27** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ වින්ඩ්කෝනර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බිලැක්පූල් නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත අංක නුවි/86/83 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 15 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් 20 පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : මාර්ග රක්ෂිතය,
*නැගෙනහිරට* : ලොට් අංක 16,
*දකුණට* : ලොට් අංක 20,
*බස්නාහිරට* : මාර්ග රක්ෂිතය.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2023 මාර්තු මස 8 වැනි දින.

09-205/4

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. එස්. ප්‍රේමසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988 අගෝස්තු 30 දින ප්‍රදානය කර ඇති අංක නු/එ/ප්‍ර/5785 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන වටගොඩ වත්ත පදිංචි වල්පිට ගමගේ ඇල්පිට හාමිනේ මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/26/355/89 අංකය යටතේ 1989.03.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.10.27** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළේ 475 ඊ තලවකැලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වටගොඩ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, පි. පි. නු. 1193 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 52 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.103 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 48 සහ 53, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 53, |
| *දකුණට* | : | මු.පි. 2741/එච් 7 සහ කැබලි අංක 51, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 51 සහ 48. |

එස්. එස්. ප්‍රේමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තලවකැලේ.

2023 ජුනි මස 19 වැනි දින.

09-205/5

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70879.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/02/SLO/43/ Uni Alloys.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 220 D ඕමන්තෙයි ග්‍රාම නිලධාරි වසමේ වෙප්පන්කුලම් ගමේ පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.0469 කට අදාළව රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ කටයුතු සඳහා යුනියන් ඇලෝයිස් සමාගම වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අනුරේඛනය VA/ VAV/ 2013/ 307 , |
| *නැගෙනහිරට* | : | පාර , |
| *දකුණට* | : | සෝලෙයිකාඩු , |
| *බටහිරට* | : | සෝලෙයිකාඩු. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.01.27 සිට 2053.01.26 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.01.27 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කල අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කේ. ආර්. මෛත්‍රී රණසිංහ,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 අගෝස්තු මස 22 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-204

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/75451.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/PP/LTL/17.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 353, කුඹුකුලාව ග්‍රාම නිලධාරි වසමේ කුඹුකුලාව ගමේ අ.ග.පි. 2850 පිඹුරට අයත් රජයේ ඉඩමෙන් කොටසක් සඳහා ජනපද නිලධාරි විසින් මැන සැකසූ දළ අනුරේඛන අංක 2023/02 හි කැබලි අංක 01 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 70 පමණ වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා රිටිස් ක්ලෝතින්ග් පොල්පිතිගම (පුද්ගලික) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 3031 (කුඹල්පෝරුගම *නොහොත්* මඩගල්ල) , |
| *නැගෙනහිරට* | : | වතුර වල හා දිය බුබුල රක්ෂිතය, එස්. එම්. කුසුමාවතීගේ ඉඩම , |
| *දකුණට* | : | කැබලි අංක 341 (අ.ග.පි. 2850 හි) සහ 309 , |
| *බටහිරට* | : | කැබලි අංක 309 (අ.ග.පි. 2850 හි) |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.08.09 දින සිට වසර 30 ක් ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල.*- අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් (ඇඟලුම් කම්හලක්) සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ)/ ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

(ඊ) සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2023.08.09 දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

(ඒ) බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොලියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. ඒ. ආර්. ටී. ශකුන්තලා විජේසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-242

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/72182.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/GAN/LTL/08.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 456, කලටුවාගම ග්‍රාම නිලධාරි වසමේ කලටුවාගම ගමේ අ.ග.පි. 1368 හි කැ. අ. 06 ප්‍රමාණයෙන් අක්කර 41, රූඩ් 02, පර්චස් 02 (හෙක්ටයාර් 16.8) පමණ විශාල වූ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුත්තක් සඳහා අබේකෝන් මුදියන්සේලාගේ චානුක සෙනරත් බණ්ඩාර අබේකෝන් මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 05, අ.ග.පි. 1369 මැදගම ගම, |
| *නැගෙනහිරට* | : | Y 1063, Z 1063, C 1064, D 1064, 13 වැව, 5, 10, 12, |
| *දකුණට* | : | 5, 10, 12, 14, 13 වැව, අ.ග.පි. 1332 තඹගල්ල ගම, |
| *බටහිරට* | : | අ.ග.පි. 1332 තඹගල්ල ගම, අ.ග.පි. 1369 මැදගම ගම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2011.09.08 දින සිට වසර 30 ක් ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2011 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොවැඩි විය යුතුය.

*වාර මුදල.*- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස් / ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

(ඊ) සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ

අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*( උ)* 2023.08.09 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. ආර්. ඒ. ටී. ශකුන්තලා විජේසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 සැප්තැම්බර් මස 15 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-309

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.